# කොවිඩ්-19 සති පාසල

## 10 ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව

## 6 පාඩම - ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා

**ශ්‍රී ලංකාවේ කාර්මික ඉතිහාසය, මිනිරන් කර්මාන්තය හා පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය (පෙළ පොත පිටු අංක 114-122)**

ක්‍රියාකාරකම

01. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්තයන් අඩපණවීමට මුල් වූ හේතුවක් සඳහන් කරන්න.
02. නිදහසෙන් පසු මෙරට තුළ රාජ්‍ය ව්‍යවසායකත්වය යටතේ ආරම්භ වූ කර්මාන්ත කිහිපයක් නම් කරන්න.
03. ශ්‍රී ලංකාවේ කාර්මික ක්ෂේත්‍රය තුළ පෞද්ගලික ව්‍යවසායකත්වයට ප්‍රමුඛත්වයක් ලැබුවේ කුමන කාලයේදී ද?
04. ශ්‍රී ලංකාවෙන් හමුවන මිනිරන්හි කාබන් ප්‍රතිශතය කොපමනද?
05. මෙරටින් සොයාගන්නා ලද මිනිරන් පරිභෝජනයට හා අපනයනයට ගනු ලබන ප්‍රතිශත ලියා දක්වන්න.
06. මිනිරන් කර්මාන්තයෙහි පවතින ගැටලු තුනක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
07. පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්ත සඳහා මැටිවලට අමතරව භාවිත කරන්නා වූ ඛනිජ වර්ග හතරක් ලියන්න.
08. පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ දියුණු වීමට හේතු පැහැදිලි කරන්න.
09. ශ්‍රී ලංකා ආකෘති සිතියමක ශ්‍රී ලංකාවේ ඛනිජ වර්ගයන්හි ව්‍යාප්ති ස්ථාන ලකුණුකර නම් කරන්න.
10. මිනිරන් කර්මාන්තය හා පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | මිනිරන් කර්මාන්තය | පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය |
|---|---|---|
| ප්‍රධාන වර්ග | | |
| පැතිරී ඇති ප්‍රදේශ | | |
| නිෂ්පාදන ද්‍රව්‍ය | | |
| වැඩි වශයෙන් අපනයනය කරන රටවල් | | |
| ගැටලු | | |
| ප්‍රවණතා | | |